කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## බාහිර විභාග අංශය

### වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

**වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි දෙවන වසර පරීක්ෂණය (බාහිර) - 2010**
**2011 දෙසැම්බර් /2012 ජනවාරි**

**BCOM E 2063 – විගණනය**

ප්‍රශ්න සංඛ්‍යාව : 05 කාලය : පැය 03 යි

සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

01. අ. සහතික වීමේ ගිවිසුමක් සඳහා වන ශ්‍රී ලංකා රාමුවට අනුව " සහතික වීමේ ගිවිසුමක් " යන්න විස්තර කරන්න.

(ලකුණු 04)

ආ. " සාධාරණ සහතික වීමේ ගිවිසුමක් " , "සීමිත සහතික වීමේ ගිවිසුමකින් " වෙන් කොට දක්වන්න.

(ලකුණු 04)

ඉ. සහතික වීමේ ගිවිසුමක් තුල පිළිබිඹු විය යුතු ලක්ෂණ විස්තර කරන්න.

(ලකුණු 12)

(මුළු ලකුණු 20)

02. අ. මව් සමාගමේ විගණකම පරිපාලිත සමාගමේ විගණක වන අවස්ථාවකදී, පරිපාලිත සමාගමට වෙනම ගිවිසුම් ලිපියක් යවන්නේද යන තීරණයට බලපාන සාධක කවරේද ?

(ලකුණු 04)

ආ. විගණන අවදානමේ කොටස් තුන සැකෙවින් පහදන්න.

(ලකුණු 06)

ඉ. " විගණකවරයෙකුට මූල්‍ය ප්‍රකාශණ සම්බන්ධව නිරපේක්ෂ සහතිකයක් ලබා ගත නොහැක " ඔබ එකඟවන්නේ ද ? ඔබගේ පිළිතුර සාධාරණීයකරණය කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

03. අ. ශ්‍රී ලං.වි.ප්‍ර 240 - මූල්‍ය ප්‍රකාශණ විගණනය කිරිමේදී වංචා සලකා බැලීමට විගණකගේ ඇති වගකීම, ට අනුව " වංචාව ", "වැරදි " වලින් වෙන් කොට දක්වන්න.

(ලකුණු 04)

ආ. 'වංචා අවදානම් සාධක' යන්න උදාහරණ සහිතව සැකෙවින් පහදන්න.

(ලකුණු 04)

ඉ. විගණකට අදාල වන හිතාමතා සිදු කරන අවප්‍රකාශන වර්ග දෙක පැහැදිලි කරන්න.

(ලකුණු 12)

(මුළු ලකුණු 20)

04. අ. විගණන ආයතනයක් විසින් තත්ව පාලන ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි ගොඩනැගීමේ දී විගණන ආයතන මට්ටමෙන් සලකා බැලිය යුතු පැතිකඩයන් කවරේද ?

(ලකුණු 08)

ආ. විගණන ආයතන මට්ටමේදි විගණන සේවා මණ්ඩලයේ ' හැකියාවන් සහ නිපුණතාවයන් ' පවත්වාගෙන යාම සඳහා සුදුසු තත්ව පාලන ක්‍රියාපටිපාටින් සැලසුම් කරන්න.

(ලකුණු 12)

(මුළු ලකුණු 20)

05. පහත ඒවා විස්තර කරන්න.

අ. විගණන සැලැස්ම

ආ. ලේඛණගත කිරිම

ඉ. ප්‍රධාන විගණක

ඊ. මූල්‍ය ප්‍රකාශ මිණුම් දඬු

(ලකුණු 05x04= ලකුණු 20)